# Sannasa Sports



## Most runs in ODI career

| Player | Span | Mat | Inns | NO | Runs | HS | Ave | SR | 100 | 50 | 0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| SR Tendulkar (India) | 1989-2009 | 430 | 419 | 39 | **16903** | 186* | 44.48 | 85.74 | 44 | 91 | 20 |
| ST Jayasuriya (Asia/SL) | 1989-2009 | 441 | 429 | 18 | **13377** | 189 | 32.54 | 91.31 | 28 | 68 | 34 |
| RT Ponting (Aus/ICC) | 1995-2009 | 323 | 314 | 36 | **12043** | 164 | 43.32 | 80.63 | 28 | 70 | 17 |
| Inzamam-ul-Haq (Asia/Pak) | 1991-2007 | 378 | 350 | 53 | **11739** | 137* | 39.52 | 74.24 | 10 | 83 | 20 |
| SC Ganguly (Asia/India) | 1992-2007 | 311 | 300 | 23 | **11363** | 183 | 41.02 | 73.70 | 22 | 72 | 16 |
| R Dravid (Asia/ICC/India) | 1996-2009 | 339 | 313 | 40 | **10765** | 153 | 39.43 | 71.17 | 12 | 82 | 13 |
| BC Lara (ICC/WI) | 1990-2007 | 299 | 289 | 32 | **10405** | 169 | 40.48 | 79.51 | 19 | 63 | 16 |
| JH Kallis (Afr/ICC/SA) | 1996-2009 | 294 | 280 | 51 | **10328** | 139 | 45.10 | 71.98 | 16 | 73 | 15 |
| AC Gilchrist (Aus/ICC) | 1996-2008 | 287 | 279 | 11 | **9619** | 172 | 35.89 | 96.94 | 16 | 55 | 19 |
| Mohammad Yousuf (Asia/Pak) | 1998-2009 | 275 | 260 | 40 | **9450** | 141* | 42.95 | 75.41 | 15 | 63 | 15 |
| M Azharuddin (India) | 1985-2000 | 334 | 308 | 54 | **9378** | 153* | 36.92 | 74.02 | 7 | 58 | 9 |
| PA de Silva (SL) | 1984-2003 | 308 | 296 | 30 | **9284** | 145 | 34.90 | 81.13 | 11 | 64 | 17 |

37 වන පිටුවෙන් (ආර්ථික කුලී ඝාතකයෙකුගේ)

විදුලි උත්පාදක ජාල හෝ වරායවල් නැත්නම් මහා මාර්ග පද්ධති වගේ ඒ රටවල ධනවත්ම පවුල්වලට ආදායම් උපදවන මාර්ගවලට අදාල දේවල් නිර්මාණය කරනවා. ඉතිං දුප්පත් මහ ජනතාව මහ විශාල ණය කන්දරාවක අන්තිමට හිර වෙනවා ඇත්තටම කවදාවත් නැවත ගෙවන්නට බැරි තරම්. අද ගත්තොත් ඉක්වදෝරය වගේ රටක ජාතික ආර්ථිකයේ සමස්ත ආදායමින් සියයට පණහක් පමණ විශාල ණයගැතිභාවයක් මේ ණය වාරික ගෙවීම නිසා නිර්මාණය වෙලා. ඒ වැඩේ කොහොමවත් ඒ අයට කරන්න බැහැ. ඒ නිසා වචනාර්ථයෙන් ඒ අයව තෙල් බැරලයක හිරවෙලා. ඉතිං අපට තෙල් වැඩියෙන් ඕන නම් කරන්න තියෙන්නේ ඉක්වදෝරයට ගිහින් කියනවා බලන්න දැං ඕගොල්ලන්ට අපේ ණය වාරික ගෙවන්න බැහැ. ඒ හින්දා අපේ තෙල් කොම්පැණි වලට ඕගොල්ලන්ගේ ඇමසන් වැසි වනාන්තර දෙන්න ඒවායේ තියෙන තෙල් ගන්න. ඉතිං අද අපි ඒ ඇමසෝනියානු වැසි වනන්තර වලට ඇතුල් වෙලා ඒවා විනාශ කරමින් අපි ඒ අයගේ එකතු වෙලා තියෙන ණය වාරික වෙනුවට පිරිමහ ගන්නවා සම්පත් සූරාගනිමින්. මේ ආකාරයට ඇමරිකානු රාජ්‍යය වෙත එම දීපු ණය සහ ණය වාරික වල පොලී මුදල් බිහිසුණු ලෙස ඉහල යාමත් සමග එම රටවල් බංකොලොත් වී ඔවුන් අපගේ සුවච කීකරු සේවකයන් හෝ වහලූන් බවට පත් වෙනවා. ඒක
අධිරාජ්‍යයක්. ඒ ගැන කතා දෙකක් නැහැ. ඒක දැවැන්ත අධිරාජ්‍යයක්. මේක අතිශය සාර්ථක ක්‍රමයක්.

**ඇමී ගුඩ්මන්**

අපි මේ කතා කරන්නේ ජෝන් පර්කින්ස් සමග. ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය නමැති කෘතියේ කතෘ සමග. ඔබ කීවා මේ පොත ලියා පළ කරන එක බොහෝ කාලයක් මග හැරුණු බව අල්ලස් සහ වෙනත් කාරණා නිසා. මොකද්ද ඔබ ඉන් අදහස් කළේ? කවුද ඔබට අල්ලස් දෙන්න හැදුවේ? නැත්නම් කවුද එහෙමත් නැත්නම් මොන අල්ලස් ද ඔබ පිළිගත්තේ?

**ජෝන් පර්කින්ස්**

හොඳයි. මම ඩොලර් මිලියන් බාගයක අල්ලසක් ගත්තා අනූ ගණන් වලදී මේ පොත නොලියන්න.

**ඇමී ගුඩ්මන්**

කාගෙන් ද?

**ජෝන් පර්කින්ස්**

ප්‍රධාන පෙලේ ඉංජිනේරු ඉදිකිරීම් සමාග මකින්

**ඇමී ගුඩ්මන්**

මොන සමාගම ද?

**ජෝන් පර්කින්ස්**

නීත්‍යාණුකූලව කතා කරනව නම් ඒ ස්ටෝනර් වෙබ්ස්ටර් නොවෙයි. නීත්‍යාණුකූලව කතා කරනව නම් ඒක අල්ලසකුත් නොවෙයි. මට ගෙවුවේ මගේ උපදේශණ සේවා සඳහායි. නමුත් මම අත්‍යවශ්‍යයෙන්ම කිසිවක් කළේ නැහැ. ඉතාම පැහැදිලිව අපි අවබෝධයෙන් හිටියා මම ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය කෘතියේ පැහැදිලි කරල තියෙන අකාරයටම ඉතාමත් පැහැදිලිව මේ සල්ලි මම භාර ගත්තේ මගේ උපදේශණ සේවාවලට බව නමුත් මට ඒ අය වෙනුවෙන් කරන්න ඒතරම් කාර්යබාරයක් නොවුනත් මම මේ විශය අරභයා කිසිම පොතක් නොලියන ආස්ථානයක හිටියත් ඔවුන් දැන සිටියා මම ඒ දවස්වල එම පොත හැඳින්වූ ආකාරයෙන්ම ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය කෘතියේ ලිවීම් කටයුතු කරමින් සිටි බව. ඇත්ත වශයෙන්ම මම ඔබට කියන්න ඕන ඇමී ඔයා දන්නවා ඒක මොන දෘෂ්ටිකෝණයෙන් ගත්තත් අසාමාන්‍ය කතාවක් ඇත්තටම ඒක ජේම්ස් බොන්ඩ්ෂ් වගේ ඇත්තටම මම අදහස් කරන විදියට...

**ඇමී ගුඩ්මන්**

ඇත්තටම පොතේ කියැවීමත් ඒකම තමයි.

**ජෝන් පර්කින්ස්**

ඔව් ඇත්තටම එහෙමයි. ඔබ දන්නව ද මම ජාතික ආරක්ෂක ආයතනයේ සම්පූර්ණ දිනයක්ම බොරු සංවේදී උපකරණ එක්ක පරීක්ෂාවට ලක් කලා කියන එක? ඒ අය මගේ සියළුම දුර්වලකම් සොයා දැනගෙන ඒවායෙන් මාව ක්ෂණිකව වශී කලා. ඔවුන් අපේ සංස්කෘතිය අනුව කළ හැකි සෑම දෙයක්ම මාව පොළඹවාගන්නට කරා ඒ කියන්නේ ලිංගික අල්ලස් - බලය ලබා දීම - සහ මුදල් වලින් මාව දිනාගන්නට උත්සාහ කළා. මම පැවත එන්නේ පරණ එංගලන්ත පවුලක කැල්විනිස්ට් කාරයෙක් විදියට බොහෝම ශක්තිමත් අධ්‍යාත්මික පදනමක් හරහා. මම හිතනවා මම ඉතාම හොඳ මනුෂ්‍යයෙක් සමස්තයක් වශයෙන් ගත්තම සහ මම හිතනවා මගේ කතාව හොඳම උදාහරණයක් මේ ක්‍රමය තුල ලිංගිකත්වය හෝ සල්ලි හෝ බලය හෝ පාවිච්චි කර මා වැනි මිනිසුන් ඒ අයට අවශ්‍ය විදියට හසුරවන්නට පෙළඹවන්නට හැකි වීම පිළිබඳව මක් නිසාද යත් මම ඇත්ත වශයෙන්ම ඔවුනට වශී වූ නිසා. සත්‍ය වශයෙන්ම මම ආර්ථික කුලී ඝාතකයෙකු නොවුන නම් මම කවදාවත් විශ්වාස කරන එකක් නැහැ මේ වගේ දේවල් මිහිපිට සිදු කරන ඒ ජාතියේ මිනිස්සු කොටසක් අපි අතරේ ඉන්නවා කියල. අන්න ඒකයි මම මේ පොත ලියා පළ කරන්නේ මොකද අපේ රට ඇත්ත වශයෙන්ම මේවා අවබෝධ කරගන්න ඕන නිසා සහ ඇත්තටම අපේ විදේශ ප්‍රතිපත්තිය කුමක් ද කියල අපේ ජනතාව දන්නව නම් හෝ විදේශ ආධාරවල යටි අරමුණ කුමක් ද කියල එහෙමත් නැත්නම් අපේ බල සංස්ථාපිතයන්ගේ සැබෑ අරමුණු මොනවා ද කියල නැත්නම් අපේ බදු සල්ලි යන්නේ කොහෙද කියල මම දන්නවා අපිට විශාල වෙනසක් ඇවැසි බව තේරුම් ගනීවි කියල.